# බස්නාහිර පළාත් ලේකම්වරුන්ගේ රැස්වීම් වාර්තාව

දිනය : 2017.01.10

වේලාව : ප.ව. 2.00

ස්ථානය : ප්‍රධාන ලේකම් කාර්යාලය, බස්නාහිර පළාත.

**සහභාගී වූ නිලධාරීන්ගේ නාම ලේඛනය :**

1) එම්.ඒ.බී. දයා සෙනරත් මයා. - ප්‍රධාන ලේකම් (බ.ප).

2) පී. සෝමසිරි මයා. - ආණ්ඩුකාර ලේකම් (බ.ප).

3) හේමන්ත සමරකෝන් මයා. - සභා ලේකම් (බ.ප).

4) චන්ද්‍රානි සමරකෝන් මිය. - ලේකම්, පළාත් පාලන අමාත්‍යාංශය (බ.ප).

5) එස්.ජී.විජයබන්ධු මයා. - ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය (බ.ප).

6) එම්.කේ.කේ.ආර්.අබේදීර මිය. - ලේකම්, ප්‍රවාහන අමාත්‍යාංශය(බ.ප).

7) කේ.කේ.චම්පිකා කනේරු මිය. - නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන).

8) සිරිසෝම ලොකුවිතාන මයා. - නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු).

9) බන්දුල ප්‍රේමකුමාර මයා. - නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය).

10) ඩී.එම්.එන්.දිසානායක මිය. - නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්).

11) ඩබ්.එම්.ඩී.එන්.රණසිංහ මයා. - නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු).

12) කණිෂ්ක ශ්‍රීලාල් මයා. - සහකාර ප්‍රධාන ලේකම් (පාලන).

13) කේ.එන්.සූරියආරච්චි මිය. - සහකාර ප්‍රධාන ලේකම් (පාලන).

14) ඒ.කේ.නන්දනී එච්. ප්‍රනාන්දු මිය. - සහකාර ලේකම්, සෞඛ්‍ය අමාත්‍යාංශය (බ.ප).

15) එස්.ඒ.එස්.ඩී. ජයසූරිය මිය. - සහකාර ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය (බ.ප).

**ලේකම්වරුන් විසින් පහත කරුණු පිළිබඳ ව සාකච්ඡා කළ අතර, පහත දක්වා ඇති තීරණයන් ට එළඹෙන ලදි.**

| අංකය | කාරණය | තීරණය | ක්‍රියාත්මක කිරීමේ බලධාරියා |
|---|---|---|---|
| 01. | බස්නාහිර පළාත් සභා කාර්යාල එක ම භූමියක ස්ථාපිත කිරීම. | බත්තරමුල්ල නව ගොඩනැගිල්ල වෙත පළාත් සභා ආයතන ගෙන යාමේ දී අධ්‍යාපන අමාත්‍යාංශය දැනට පවතින ස්ථානයේ ම පවත්වා ගැනීමටත්, අධ්‍යාපන දෙපාර්තමේන්තුව, දැනට මාර්ග හා ප්‍රවාහන අමාත්‍යාංශය පවතින ගොඩනැගිල්ල වෙත ගෙන යාමටත්, අමාත්‍ය මණ්ඩලය වෙත යෝජනා කරන බව ප්‍රධාන ලේකම් විසින් ප්‍රකාශ කරන ලදී. මේ සම්බන්ධව ප්‍රධාන අමාත්‍යතුමා සමඟ සාකච්ඡාවක් පැවැත්වීමට ද, තීරණය විය. | සභා ලේකම් සහ කමිටු සාමාජිකයින් |
| 02. | නිල නිවාස පිළිබඳ කාර්ය සාධන බලකාය සහ සංචාරක බංගලා ඉදි කිරීම | අනුරාධපුර, නුවරඑළිය සහ කතරගම යන ප්‍රදේශ වල සංචාරක බංගලා ඉදිකිරීමට අවශ්‍ය ඉඩම් හෝ පසුගිය වසර 5 තුල දී සාදා නිම කරන ලද නිවාස සහිත ඉඩම් මිල දී ගැනීම වෙනුවෙන් ලංසු කැඳවීම අවශ්‍ය නොවන බැවින්, සංශෝධිත පුවත්පත් දැන්වීම පළ කිරීම සඳහා ඉදිරි කටයුතු කිරීම. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු).<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන). |
| 03. | සංවර්ධන වැඩසටහන් සහ ප්‍රගති සමාලෝචනය. | එක් එක් අමාත්‍යාංශ මඟින් මෙම වසරේ ජනවාරි මුල් සතිය තුල දී ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති වල ප්‍රගතිය පිළිබඳ විමසීමක් ප්‍රධාන ලේකම් විසින් සිදු කරන ලදී.<br><br>අතිගරු ජනාධිපතිතුමාගේ සංවර්ධන වැඩසටහන යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති 79 සහ හොරණ මාර්ගය ඉදිකිරීම ඇතුළු ව්‍යාපෘති නිරීක්ෂණය කර, එහි දී ගන්නා ලද ඡායාරූප සහ විස්තර ගරු ආණ්ඩුකාරතුමා හා ප්‍රධාන ලේකම් වෙත විද්‍යුත් තැපැල මඟින් යොමු කිරීම. | සියලු ම අමාත්‍යාංශ ලේකම්වරුන්<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) |
| 04. | භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා පළාත් නිල වෙබ් අඩවිය යාවත්කාලීන කිරීම. | පෙබරවාරි මාසය වන විට තොරතුරු දැන ගැනීමේ පනත ක්‍රියාත්මක කිරීමේ කටයුතු සිදු කළ යුතු බැවින්, ඊට අදාළ සූචි ද, සකස් කර, සියලු වෙබ් අඩවි සම්පූර්ණ කළ යුතු බව ප්‍රධාන ලේකම් අවධාරණය කරන ලදී.<br><br>එසේම, පළාත් සභාවේ සියලු ම අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ ආයතන වල වෙබ් අඩවි ප්‍රධාන ලේකම් විසින් නිරීක්ෂණය කරන බැවින්, වෙබ් ලිපින ඉදිරිපත් කිරීම. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු)<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) |
| 05. | තොරතුරු තාක්ෂණය මඟින් සේවා වැඩි දියුණු කිරීම. | බස්නාහිර පළාතේ ආයතන වලින් ලබා දෙන සේවාවන් වැඩිදියුණු කිරීමට තොරතුරු තාක්ෂණය යොදාගැනීම පිළිබඳ මඟ පෙන්වීම සඳහා, පවතින තත්ත්වය අධ්‍යයනය කර කඩිනමින් වාර්තාවක් සකසා ඉදිරිපත් කිරීම. | ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය සහ කමිටු සාමාජිකයන් |

| | | | |
|---|---|---|---|
| 06. | 2017 - දිළිඳුකමින් නිදහස් කිරීමේ වර්ෂය | 2017 වසරේ මුල් කාර්තුවේ නියං කාලගුණයක් අපේක්ෂා කරන බැවින් ඊට සමගාමීව පළාත් සැලැස්මක් කඩිනමින් සකසා ඉදිරිපත් කිරීම.<br><br>එහි දී, නාගරික වගාවන් සහ විශේෂ ව්‍යාපෘති පිළිබඳව විශේෂ අවධානය යොමු කිරීම හා පුවත්පත් දැන්වීමක් මඟින් ප්‍රජාව දැනුවත් කිරීම සුදුසු බව තීරණය විය. | ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය.<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) |
| 07. | සංවර්ධන නිලධාරි අතිකාල දීමනා ලබා දීම. | පහත කරුණු ගරු ආණ්ඩුකාරතුමා වෙත ඉදිරිපත් කිරීම.<br>• ක්ෂේත්‍ර නිලධාරීන් ලෙස රු.300/- මාසික දීමනාව හෝ යතුරුපැදි ලබා ගත් නිලධාරීන් හට 1/30 දීමනාව ලබා දීම.<br>• ක්ෂේත්‍ර නිලධාරීන් ලෙස නම් කළ ද, යතුරුපැදි හා රු.300/- මාසික දීමනාව නොලබන නිලධාරීන් හට යතුරුපැදි ලැබෙන තෙක් අතිකාල ලබා දීම.<br><br>සමාජ සේවා/ග්‍රාම සංවර්ධන නිලධාරීන් යතුරුපැදි සහ දින වැටුප් ගන්නේ ද, එසේ ලබා ගන්නේ කුමන පදනමකින් ද, යන්න අදාළ අමාත්‍යාංශ වෙතින් විමසීම. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) |
| 08. | සංවර්ධන නිලධාරි ස්ථාන මාරු සහ ඇබෑර්තු සම්බන්ධ ගැටලුව | සංවර්ධන නිලධාරීන් සඳහා ස්ථාන මාරු ප්‍රතිපත්තියක් සකසා ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා ගෙන, 2017 වාර්ෂික ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීම.<br>නව උපාධිධාරී අභ්‍යාසලාභීන් බඳවා ගැනීම සඳහා, බස්නාහිර පළාත් සභා ආයතන තුළ දැනට පවතින සංවර්ධන නිලධාරි ඇබෑර්තු ප්‍රමාණය 2017.01.16 දිනට ප්‍රථම දන්වා එවන මෙන් ප්‍රධාන ලේකම් දැනුවත් කරන ලදී. | ලේකම්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව.<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු)<br><br>සියලුම අමාත්‍යාංශ ලේකම්වරු. |
| 09. | වෙනිවැල්කොල ව්‍යාපෘතියට අයත් අත් කඩදාසි යන්ත්‍ර කොලොන්නාව කසල අංගනයට බැහැර කිරීම. | කොලොන්නාව කසල අංගනයේ ඇති අත් කඩදාසි යන්ත්‍රයේ කොටස් පරීක්ෂා කර බලා කොලොන්නාව නගර සභා භාරයට ගන්නා ලෙස දන්වා යැවූ ලිපි ප්‍රකාර ව කටයුතු සිදු වනවාද යන්න තහවුරු කිරීම.<br><br>මෙ සම්බන්ධයෙන් කරන ලද විමර්ශන වාර්තාව ප්‍රවාහන හා කර්මාන්ත අමාත්‍යාංශ ලේකම් වෙත ඉදිරිපත් කර ඇති බැවින්, එහි නිර්දේශ ප්‍රකාර ව කටයුතු ඉටු කළ බව දැක්වෙන වාර්තාව 2016.01.19 දිනට පෙර ඉදිරිපත් කිරීම. | ලේකම්, පළාත් පාලන අමාත්‍යාංශය.<br><br>ලේකම්, ප්‍රවාහන අමාත්‍යාංශය. |

<u>නව යෝජනා</u>

| අංකය | කාරණය | තීරණය | ක්‍රියාත්මක කිරීමේ බලධාරියා |
|---|---|---|---|
| 01. | ඔලියමුල්ල මහා විද්‍යාලය ඉදිකිරීම සම්බන්ධව. | ගරු ආණ්ඩුකාරතුමාගේ උපදෙස් පරිදි, ඔලියමුල්ල ප්‍රදේශයේ නව හින්දු විද්‍යාලයක් ඉදිකිරීමේ වගකීම ප්‍රධාන ලේකම් වෙත පවරා ඇති බැවින්, නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) විසින් සකසා ඇති ඇස්තමේන්තුව ද සමඟින් ගරු ආණ්ඩුකාරතුමා සමඟ සාකච්ඡාවක් සඳහා දිනයක් යොදා ගැනීම. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු)<br><br>ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය. |
| 02. | ගරු ආණ්ඩුකාරතුමාගේ නිල නිවස ඉදිකිරීම. | දැනට නිල නිවස සම්බන්ධව ඇති ගැටලු වන භූමිය වෙන් කර ගැනීම, විදුලිය ලබාගැනීම යන කරුණු සම්බන්ධව නොපමාව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම. | ආණ්ඩුකාර ලේකම් (බ.ප)<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) |
| 03. | මෙත් සෙවන රජයේ නිවර්තන නිවාසය පිහිටි ඉඩම ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයට පැවරීම. | මෙත් සෙවන ආයතනයෙහි මානසික ආබාධිත නොවන නේවාසිකයින් සන්ෆ්ලවර් විලේජ් ආයතනය වෙත ගෙන යාමට අදාළ තීරණය කඩිනමින් ක්‍රියාත්මක කිරීම සම්බන්ධ විශේෂ සාකච්ඡාවක් 2017.01.17 දින ප.ව.2.30ට සූදානම් කිරීම.<br>ඒ සඳහා කොලොන්නාව ප්‍රාදේශීය ලේකම්, විශ්ව විද්‍යාල පාර්ශවයන්, නීති නිලධාරි හා සන්ෆ්ලවර් විලේජ් ආයතනයේ හිමිකරු සම්බන්ධ කර ගන්නා ලෙස ප්‍රධාන ලේකම් වැඩි දුරටත් ප්‍රකාශ කරන ලදි. | ලේකම්, සෞඛ්‍ය අමාත්‍යාංශය.<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) |
| 04. | බස්නාහිර පළාත් කර්මාන්ත අධිකාරිය ඉදිරියට පවත්වා ගෙන යාම පිළිබඳ තීරණය | බස්නාහිර පළාතේ කර්මාන්ත අධිකාරිය ඇවර කිරීම හෝ ඉදිරියට පවත්වා ගෙන යාම පිළිබඳ ව ඉදිරිපත් වී ඇති යෝජනාව සඳහා නිරීක්ෂණ ඉදිරිපත් කිරීමට මසක කාලයක් ලබා දෙන ලෙස ඉල්ලා ගිණුම්කාරක සභාව වෙත ලිපියක් ඉදිරිපත් කිරීම. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මුල්‍ය) |
| 05. | අභ්‍යන්තර විගණන නිලධාරීන් අමාත්‍යාංශ වෙත අනුයුක්ත කිරීම. | නව අභ්‍යන්තර විගණන නිලධාරීන් 8ක් බඳවා ගෙන ඇති බැවින්, නිලධාරීන් දෙදෙනෙකු බැගින් සියලු ම අමාත්‍යාංශ වෙත අනුයුක්ත කිරීම සඳහා ප්‍රධාන ලේකම් අනුමැතිය පළ කළ අතර, ඔවුන් සඳහා මාසික වැඩ සැලැස්මක් ලබා දී එහි පිටපතක් අධ්‍යක්ෂ-අභ්‍යන්තර විගණන වෙත ද යොමු කිරීම කටයුතු කිරීම. | සියලුම ලේකම්වරුන් |
| 06. | මහජන සෞඛ්‍ය පරීක්ෂක වරුන්ගේ වෘත්තීය සමිති ක්‍රියාමාර්ගය සම්බන්ධව යොමු කර ඇති ලිපිය. | මහජන සෞඛ්‍ය පරීක්ෂක නිලධාරීන් සමඟ ක්ෂේත්‍ර රාජකාරි කටයුතු සඳහා ප්‍රජා සංවර්ධන නිලධාරීන් යෙදවීමට ගන්නා ලද තීරණය තාවකාලිකව අත්හිටුවා ඇති බව පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්, ප්‍රධාන ලේකම් වෙත ප්‍රකාශ කළ අතර, මේ සම්බන්ධව ඉදිරි කටයුතු සලකා බැලීම. | ලේකම්, පළාත් පාලන අමාත්‍යාංශය |

| | | | |
|---|---|---|---|
| 07. | ටෙන්ඩර් ලියවිලි ලබා ගැනීම ට ගිය විට හා වෙනත් අවස්ථා වල දී වන අසාධාරණකම් සම්බන්ධ පෙත්සම. | (නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) විසින් ඉදිරිපත් කරන ලද CSO/ENG/1/1/1 අංක හා 2016.12.08 දිනැති ලිපිය මගින් ඉදිරිපත් වූ යෝජනාව) ඉංජිනේරු අංශයේ සේවය කරනු ලබන කළමනාකරණ සහකාර නදීජා මහත්මිය, කැලණිය කලාප කාර්යාලය වෙත ස්ථාන මාරු කර හැරීම. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු)<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) |
| 08. | පළාත් පාලන දෙපාර්තමේන්තුවේ හා පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලයන් හි සේවය කරන නිලධාරීන්ට නිවාඩු දින වැටුප් ගෙවීම. | (පළාත් පාලන අමාත්‍යාංශ ලේකම් විසින් යොමු කරන ලද සීඑම්/ඩබ්පී/ඊ10/9-2(LG) අංක හා 2016.10.28 දිනැති ලිපිය මගින් ඉදිරිපත් වූ යෝජනාව) පළාත් පාලන දෙපාර්තමේන්තුවේ හා පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලයන් හි සේවය කරන නිලධාරීන්ට (ඇමුණුමෙහි නම් සඳහන්) 2016 සැප්. මස සිට 2017 ජනවාරි මස දක්වා දැනට අනුමත නිවාඩු දින 02ට අමතරව, දින 04ක් නිවාඩු දින වැටුප් ගෙවීම. (ක්ෂේත්‍ර නිලධාරීන් හැර) | ලේකම්, පළාත් පාලන අමාත්‍යාංශය.<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) |
| 09. | රාජ්‍ය ආයතන වල සේවක දිනයක් ප්‍රකාශයට පත් කිරීම හා ක්‍රියාත්මක කිරීම - 2017 | "රාජ්‍ය ආයතන වල සේවක දිනයක් ප්‍රකාශයට පත් කිරීම හා ක්‍රියාත්මක කිරීම" යන මැයෙන් ජනාධිපති ලේකම් විසින් යොමු කරන ලද CA/01/PA/14 අංක හා 2016.12.21 දිනැති ලිපිය පිළිබඳ ලේකම්වරුන් සහ නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන් දැනුවත් කළ අතර, ඉදිරියේ දී ලේකම්වරුන් වෙත උපදෙස් පත්‍රිකාවක් එවීම සඳහා කටයුතු කරන බව හා සේවක දිනය ලෙස මාර්තු 31 දිනය යොදාගැනීම සම්බන්ධව ප්‍රධාන අමාත්‍යතුමා දැනුවත් කිරීමට කටයුතු කරන බව ද ප්‍රධාන ලේකම් විසින් ප්‍රකාශ කරන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) |
| 10. | බත්තරමුල්ල නව පළාත් ගොඩනැගිල්ලේ පරිගණක ජාලගත කිරීම. | බත්තරමුල්ල නව පළාත් සභා ගොඩනැගිල්ලේ පරිගණක ජාලගත කිරීමට අදාළ ව නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) විසින් ඉදිරිපත් කර තිබූ කරුණු පිළිබඳ ව ප්‍රධාන ලේකම්, ලේකම්වරුන් සමඟ සාකච්ඡා කළ අතර, බස්නාහිර පළාත තුල තොරතුරු තාක්ෂණ පද්ධතියක් ඇති කිරීමට (ICT Road Map) අදාළ ව කොළඹ විශ්වවිද්‍යාලය මගින් ඉදිරිපත් කර තිබූ මිල ගණන් පිළිබඳ ව තව දුරටත් සලකා බැලීම හා ඉදිරි කටයුතු සිදු කිරීම. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) |